# රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - 2022.09.27

## රැස්වීම් වාර්තාව

01. දිනය:-2022.09.27
02. ස්ථානය:- රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය
03. ප්‍රධානත්වය:-
    රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමා
04. මෙහෙයවීම:- රත්නපුර දිස්ත්‍රික් ලේකම්/දිසාපති
05. සහභාගිත්වය:-

| නම | තනතුර |
|---|---|
| අකිල සාලිය එල්ලාවල මැතිතුමා | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති,රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී |
| ජානක වක්කුඹුර මැතිතුමා | පළාත් සභා හා පළාත් පාලන ගරු රාජ්‍ය අමාත්‍ය |
| ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා | වරාය හා ගුවන් සේවා ගරු රාජ්‍ය අමාත්‍ය |
| ගාමිණී ජයනන්ද වලේබොඩ මැතිතුමා | රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී |
| වරුණ ප්‍රියන්ත ලියනගේ මැතිතුමා | රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී |
| ටිරෝන් අත්තනායක මැතිතුමා | ගරු නගරාධිපති,මහනගර සභාව,රත්නපුර |
| ඩබ්ලිව් .ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා | ගරු සභාපති, නගර සභාව බලංගොඩ |
| ප්‍රේමරත්න මල්කැකුළ මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව,කුරුවිට |
| ටී. රූපසේන මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව කොලොන්න. |
| ප්‍රියන්ත බණ්ඩාර මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව,ගොඩකවෙල |
| සුසිල් ප්‍රේමසිරි මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව බලංගොඩ |
| කැළුම් ප්‍රියන්ත ජයසිංහ මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව වැලිගෙපොල |
| කේ.ඇම්.ජිනදාස මැතිතුමා | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව කහවත්ත |
| රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති ( වැබ), ප්‍රාදේශීය සභාව, ඇහැලියගොඩ |
| රම්‍ය කුමාර වීරසිංහ මැතිතුමා | සභාපති, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ,සබරගමුව පළාත් සභාව |
| එම් ඩබ්ලිව් විමලසිරි මැතිතුමා | ගරු විපක්ෂ නායක, නගර සභාව ,බලංගොඩ |
| මංජුලා ඉදිගහවෙල මිය | ආණ්ඩුකාරවර පෞද්ගලික ලේකම් |
| ධම්මික ජයකොඩි මහතා | ජානක වක්කුඹුර මැතිතුමාගේ පෞද්ගලික ලේකම් |
| අජිත් ගුණවර්ධන මහතා | අකිල එල්ලාවල මැතිතුමාගේ පෞද්ගලික ලේකම් |
| හේමන්ත දිමුත් ජයසේකර මහතා | ඩබ්ලිව්සෙනෙවිරත්න මැතිතුමාගේ පෞද්ගලික ලේකම්.ජේ.ඩී. |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 1 | සුනිල් ජයලත් මහතා, | ප්‍රධාන ලේකම්, | සබරගමුව පළාත් සභාව |
| 2 | මාලනී ලොකුපෝතාගම මිය | දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 3 | එච්.ඩී.සිසිර මහතා | ආණ්ඩුකාරවර ලේකම් | සබරගමුව පළාත් සභාව |
| | | ලේකම් | ඉඩම් පළාත් වාරි මාර්ග කෘෂි කර්ම සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, |
| 4 | ප්‍රභාත් උදාකර මහතා | ලේකම්, | ප්‍රධාන අමාත්‍යාංශය,සබරගමුව පළාත් සභාව |
| 5 | එස්.ආර්.විජේතුංග මිය | ලේකම්, | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව |
| 6 | බී.ඒ. චාමර පී. බමුණු ආරච්චි මහතා, | ලේකම්, | පළාත් මාර්ග ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක, ක්‍රීඩා, යෞවන කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව |
| 7 | ඒ.එස්.ජේ. ගොඩැල්ලවත්ත මහතා, | ලේකම්, | සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, |
| 8 | පරාක්‍රම පියසේන මහතා, | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) | සබරගමුව පළාත් සභාව |
| 9 | අජිත් පනාගොඩ මහතා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | සබරගමුව පළාත් සභාව |
| 10 | ගයනි අයි කරුණාරත්න මිය | අතිරේක දිස්ත්‍රික් ලේකම්, | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 11 | ජී.ඩී.එල්. උදයකුමාරි මෙනවිය | අතිරේක දිස්ත්‍රික් ලේකම්, | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 12 | ඩබ්ලිව්.පී. සමන්තිලක මහතා, | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 13 | එස්.ඩී.ඩී. ප්‍රනාන්දු මහතා, | ප්‍රධාන ගණකාධිකාරී. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 14 | අයි.ඒ.ඩී.සී. ටී කුමාරි මිය | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 15 | ආර්.යු.ඩී.එල්. කරුණාරත්න මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 16 | ජේ.එස්. වීරසේකර මහතා | නියෝජ්‍ය පොලිස්පති | නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය , රත්නපුර |
| 17 | වෛද්‍ය ශ්‍රීනි අලහප්පෙරුම මිය | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, රත්නපුර. |
| 18 | වෛද්‍ය ඩග්ලස් පතිරගේ මහතා, | පළාත් ආයුර්වේද කොමසාරිස්, | සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, රත්නපුර |
| 19 | කේ.එම්.තිලකරත්න මහතා | පළාත්භාර අධ්‍යක්ෂ(සබරගමුව), | මාර්ග සංවර්ධන අධිකාරිය, රත්නපුර. |
| 20 | කේ.එම්. දුෂ්‍යාන්ති මිය | පළාත් අධ්‍යක්ෂ, | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් සභාව, නවනගරය, |
| 21 | සුගත් ප්‍රේමසිරි මහතා, | අධ්‍යක්ෂ (සබරගමුව පළාත), | නාගරික සංවර්ධන අධිකාරිය, රත්නපුර |
| 22 | කේ.එම්.ඒ.ජේ. රණසිංහ මහතා, | පළාත් ඉඩම් කොමසාරිස් | සබරගමුව පළාත් සභාව,රත්නපුර |
| 23 | දිලිනි ධර්මදාස මිය, | සමූපකාර සංවර්ධන කොමසාරිස් | සබරගමුව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් සභාව |
| 24 | එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර මහතා, | පළාත් පාලන කොමසාරිස්, | සබරගමුව පළාත් සභාව , |
| 25 | ජේ.ඒ.ඒ.පී.ජයසිංහ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, |
| 26 | දමිත අගුණවල මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, | ශ්‍රී ලංකා ටෙලිකොම්, රත්නපුර. |
| 27 | වෛද්‍ය එම්.ඩී.ඒ. රොඩ්රිගෝ මහතා, | අධ්‍යක්ෂ | ශික්ෂණ රෝහල, රත්නපුර |
| 28 | කුමාරි ගමඇතිගේ මිය | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් , | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, |
| 29 | එච්.සී.එන්. ධර්මපාල මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇහැලියගොඩ |
| 30 | එස්.ඒ. දිල්රුක් මහත්මිය, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇලපාත |
| 31 | ඩී.පී.ජී. රේණුකා මහත්මිය, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පෙ. |
| 32 | අයි.ආර්.එම්.පී.ඩී. ඉලුක්කුඹුර මහත්මිය, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රත්නපුර. |
| 33 | එච්.එම්.එච්. බණ්ඩාර මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බලන්ගොඩ |
| 34 | එච්.ඩී.සතරසිංහ මයා | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඕපනායක |
| 35 | බී.එස්.ජී.රුවන්සිරි මහතා | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පැල්මඩුල්ල |
| 36 | බී.එම්.බී.එම්.ඒ. බටුගෙදර මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුවිට |
| 37 | බී.එස්.ජී.රුවන්සිරි මහතා (වැ.බ) | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කහවත්ත |
| 38 | ජී.ඩබ්ලිව්. රංජිත් ජයලාල් මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිවිතිගල |
| 39 | සංජීවනී ආර්. කණ්ඩම්බි මිය, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලවාන. |
| 40 | එස්.එම්.ඩී.සී. සමරසේකර මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කිරිඇල්ල |
| 41 | ජී.එල්.ඩබ්.ඒ.ප්‍රතිභා මිය | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොඩකවෙල |
| 42 | අමිල විජේරත්න මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොලොන්න |
| 43 | අනුරාධ ජයකොඩි මහතා, | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වැලිගෙපොල |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 44 | ජී.ජී. නිලන්ති වීරසූරිය මිය | ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කල්තොට. |
| 45 | යූ.එම්.ඩී.බණ්ඩාර මහතා | සහකාර ප්‍රාදේශීය ලේකම්, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අයගම |
| 46 | වයි.ආර්.එස්.පලිහවඩන මහතා , | අධ්‍යක්ෂ (ගොඩනැගිලි ), | ඉංජිනේරු සේවා කාර්යාලය, නව නගරය, රත්නපුර. |
| 47 | කේ. චාන්දනී පුෂ්පකුමාරි මිය , | අධ්‍යක්ෂ ( මාර්ග ) | ඉංජිනේරු සේවා කාර්යාලය, |
| 48 | සුරංග අඹගහතැන්නෙ මහතා | අධ්‍යක්ෂ(වැ.බ), | කර්මාන්තපුරය, පැරඩයිස්, කුරුවිට. |
| 49 | ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 50 | සුමිත් අමරසිංහ මහතා | දිස්ත්‍රික් ඉංජිනේරු, | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 51 | විජයානී රත්නායක මිය, | නියෝජ්‍ය අධ්‍යක්ෂ ( මාර්ග), | ඉංජිනේරු සේවා කාර්යාලය, නව නගරය, රත්නපුර. |
| 52 | ඩී.පී.අමරසිරි මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ, | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් සභාව, නවනගරය, |
| 53 | බී.පි දයාවංශ මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 54 | අනුරුද්ධ බණ්ඩාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 55 | ඒ.ඒ.පි.සරෝජිනි මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 56 | බී.බී.එස්. ධනවර්ධන මිය, | සහකාර දිස්ත්‍රික් ලේකම්. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 57 | එච්.පී. කරුණාතිලක මහතා, | නියෝජ්‍ය අධ්‍යක්ෂ, | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, රත්නපුර. |
| 58 | ඩබ්ලිව්. විදුර කාශ්‍යප දේශප්‍රිය මහතා | වාරිමාර්ග ඉංජිනේරු, | වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, රත්නපුර |
| 59 | කේ.එම්.එස්.සී. වේරහැර මහතා | විධායක ඉංජිනේරු , | විධායක ඉංජිනේරු කාර්යාලය, රත්නපුර |
| 60 | ආර්.එම්.ආර්.එස්. ආර්. සෙනෙවිරත්න මිය, | විධායක ඉංජිනේරු , | විධායක ඉංජිනේරු කාර්යාලය, බලංගොඩ |
| 61 | කේ.කේ.ගුණරත්න මහතා, | විධායක ඉංජිනේරු , | විධායක ඉංජිනේරු කාර්යාලය, ඇඹිලිපිටිය |
| 62 | යූ.එස්. පී උඩවත්ත මහතා, | විධායක ඉංජිනේරු , | විධායක ඉංජිනේරු කාර්යාලය, කලවාන |
| 63 | බී.ඒ.එම්.එස්.එච් බෙලිගස්වත්ත මහතා | විධායක ඉංජිනේරු , | විධායක ඉංජිනේරු කාර්යාලය, පැල්මඩුල්ල |
| 64 | ඩී.ඒ.එස්.එස්. විජේසිංහ මිය | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය, රත්නපුර |
| 65 | ඩබ්.එච්.එන්.එච්.දයානන්ද මිය | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය, නිවිතිගල |
| 66 | පී.ජී.ආරියපාල මහතා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය, බලංගොඩ |
| 67 | ලුති/කර්නල් ජී.ජී. අනුර අබේවික්‍රම මහතා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය, ඇඹිලිපිටිය |
| 68 | ඩී.එම්. විමලවීර මහතා, | දිස්ත්‍රික් කළමනාකරු, | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, |
| 69 | ඒ.එම්.පී.කේ . අලහකෝන් මහතා | ප්‍රාදේශීය කළමනාකරු, | ප්‍රාදේශීය කාර්යාලය,ලංගම , අවිස්සාවේල්ල. |
| 70 | ඩබ්.ඩී.එම්.ඩී.ආර්.කේ.ගුණසේන මහතා | ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු, | ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය,ලංකා විදුලිබල මණ්ඩලය, ඇහැලියගොඩ. |
| 71 | ඒ.එච්.ටී. තක්ෂිලා ජයමිණි මිය | පීඨාධිපති, | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය,වැල්ලඳුර,කහවත්ත |
| 72 | ඩී.එස්. සේනක වීරසිංහ මහතා, | පොලිස් අධිකාරී, | පොලිස් අධිකාරී කාර්යාලය, රත්නපුර. |
| 73 | ඇහැලියගොඩ මහතා | ප්‍රධාන ඉංජිනේරු , | මාර්ග සංවර්ධන අධිකාරිය රත්නපුර |
| 74 | බී.ජී.අයි.ඒ.කරුණාරත්න මහතා | විධායක ඉංජිනේරු , | මාර්ග සංවර්ධන අධිකාරිය රත්නපුර |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 75 | එම්.ඒ.කුමාර මහතා | විධායක ඉංජිනේරු , | මාර්ග සංවර්ධන අධිකාරිය, ඇඹිලිපිටිය |
| 76 | ඊ.ඒ.එස්.විජේසිරි මහතා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරිය - පැල්මඩුල්ල |
| 77 | එස්. අබේසිංහ මහතා, | ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු, | භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, හිදැල්ලන, |
| 78 | සිසිර කුමාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) , | සබරගමුව පළාත් සභාව |
| 79 | ටී.අයි.එස්.කේ.කොඩිතුවක්කු මහතා | අධ්‍යක්ෂ(ප්‍රාදේශීය), | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, |
| 80 | එච්.ඊ.එම්.ඒ.ඩබ්ලිව්.එස්. අමුණුගම මිය | අධ්‍යක්ෂ, | තාක්ෂණ විද්‍යාලය, හිදැල්ලන, රත්නපුර. |
| 81 | එම්.ටී.ඒ.යූ. මුණවීර මහතා. | බෞද්ධ කටයුතු සහකාර කොමසාරිස්. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 82 | ආර්.ඩී.පී.එච්.ප්‍රියන්ත ජයසේන මහතා, | සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 83 | එම්.එල් සෙනවිරත්න මහතා, | සහකාර අධ්‍යක්ෂ, | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇඹිලිපිටිය |
| 84 | අයි.මංචනායක මහතා | සහකාර අධ්‍යක්ෂ, | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, රත්නපුර. |
| 85 | එස්.එච්.එම්. මංජුල මහතා, | සහකාර අධ්‍යක්ෂ(දිස්ත්‍රික්), | ආපදා කළමනාකරණ ඒකකය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 86 | ඩබ්.ආර්.එන්.දීපාගොඩ මහතා | සහකාර අධ්‍යක්ෂ,, | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 87 | ආර්.පී.එම්. වීරසිංහ මහතා, | දිසාවන නිලධාරී | දිසාවන කාර්යාලය, රත්නපුර. |
| 88 | එන්.ඒ.එල්.අමරසේන මහතා | ප්‍රාදේශීය කළමනාකාර | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, රත්නපුර |
| 89 | එස්.ඩී. ගමගේ මහතා, | දිස්ත්‍රික් කළමනාකරු | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, ලෙල්ලෝපිටිය. |
| 90 | එච්.එල්.නන්දන මහතා, | ප්‍රාදේශීය කළමනාකරු, | රාජ්‍ය දැව සංස්ථාව, |
| 91 | ආර්.එම්.ගාමිණී සමරකොන් මහතා | ප්‍රාදේශීය කළමනාකරු, | පොල් වගා කිරීමේ මණ්ඩලය, |
| 92 | වයි.එස්. පියතිලක මහතා, | දිස්ත්‍රික් කළමනාකරු, | ජාතික ආධුනිකත්ව , කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, |
| 93 | එච්.ජී. එන්. ප්‍රේමකාන්ති මිය, | ව්‍යාපෘති අධ්‍යක්ෂ, | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, |
| 94 | එස්.එල්.ටී.එන්. දම්සෙන් මහතා | සහකාර කම්කරු කොමසාරිස්. | දිස්ත්‍රික් කම්කරු කාර්යාලය, මොරගහයට, රත්නපුර. |
| 95 | ඩබ්ලිව්. වී. වික්‍රමසිංහ මහතා, | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ, | මධ්‍යම පරිසර අධිකාරිය, නවනගරය, රත්නපුර. |
| 96 | ඉන්ද්‍රානි තෙවරප්පෙරුම මිය | ජ්‍යෙෂ්ඨ කළමනාකරු, | විදේශ සේවා නියුක්ති කාර්යාංශය, නව නගරය, රත්නපුර. |
| 97 | ආර්. එච්. රංජනී දිසානායක මිය | සහකාර කොමසාරිස්, | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, බලන්ගොඩ. |
| 98 | එම්.ජී.ජී.පී. ධර්මකීර්ති මිය | සහකාර කොමසාරිස්, | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ෆාම්ගාඩන්, නවනගරය, රත්නපුර/කුරුවිට. |
| 99 | අජිත වනසුන්දර මහතා, | දිස්ත්‍රික් නිලධාරී, | ( NBRO ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ගැටන්ගම, රත්නපුර. |
| 100 | ඩබ්. අසංක සම්පත් මහතා, | සහකාර අධ්‍යක්ෂ, | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම, ෆාම්ගාඩන්, නවනගරය, රතනපුර. |
| 101 | බී.ජී. කුමාරි ප්‍රේමලතා මිය, | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ. | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛන ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 102 | ජී.වී.මනෝරත්න මහතා, | සහකාර අධ්‍යක්ෂ, | කුඩා ව්‍යාපාර අංශයදිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 103 | ටී.එම්.එස්. තෙන්නකෝන් මහතා, | සහකාර අධ්‍යක්ෂ, | ජාතික පොහොර ලේකම් කාර්යාලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 104 | මේජර් ජී.ඩී.ඒකනායක මහතා | සහකාර අධ්‍යක්ෂ, | බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 105 | ජී.ඩග්ලස් බණ්ඩාර මහතා | සහකාර අධ්‍යක්ෂ | පුරාවිද්‍යා කාර්යාලය, රත්නපුර |
| 106 | ඩබ්.පී.කේ. පී.වීරසූරිය මහතා | ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය |
| 107 | ඩබ්ලිව්.එම්.එස්.එන්. වනසුන්දර මිය. | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, |
| 108 | ඊ.පී.බී.සී.ගුණවර්ධන මහතා | ජ්‍යෙෂ්ඨ මිණින්දෝරු අධිකාරී,වෙනුවට | දිස්ත්‍රික් මිණින්දෝරු අධිකාරී කාර්යාලය, රත්නපුර. |
| 109 | ඩබ්ලිව්.පී.දිනූෂා ලක්මාලි මිය | නේවාසික ව්‍යාපාර කළමනාකාර,වෙනුවට | මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 110 | මහාචාර්ය සමන් උයන්ගොඩ මහතා, | උපකුලපති වෙනුවට, | තැ.පෙ.02, සබරගමුව විශ්ව විද්‍යාලය, බෙලිහුල්ඔය. |
| 111 | ඒ.ජී.ඒ. සරත් කුමාර මහතා, | සහකාර අධ්‍යක්ෂ වෙනුවට | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, |
| 112 | එස්.සී.ආටිගල මහතා. | පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් වෙනුවට | සබරගමුව පළාත් සභාව, |
| 113 | පී.සී.එස්.කුමාරි මිය. | සහකාර අධ්‍යක්ෂ(දි.ඉ.ප.) වෙනුවට | ඉඩම් පරිහරණ සැලසුම් අංශය.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 114 | ඩබ්ලිව්.ආර්.එස්.චාලක මහතා, | සහකාර තේ කොමසාරිස්,වෙනුවට | ශ්‍රී ලංකා තේ මණ්ඩල ප්‍රාදේශීය කාර්යාලය, නවනගරය, රත්නපුර. |
| 115 | එම්.වයි.එම්.ආශීර් මහතා | ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවට | විසල් රත්නපුර ව්‍යාපෘතිය,ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, |
| 116 | චාමිනී ජයනා රාජපක්ෂ මිය, | සහකාර අධ්‍යක්ෂ වෙනුවට | ජාතික තරුණ සේවා සභාව,දිස්ත්‍රික් කාර්යාලය, |
| 117 | ඩී.ආර්.එන්.රත්නකුමාර මහතා, | නියෝජ්‍ය තැපැල්පති(සබරගමුව),වෙනුවට | නියෝජ්‍ය තැපැල්පති කාර්යාලය, රත්නපුර. |
| 118 | එස්.රුවන් පතිරණ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙනුවට, | ලංකා විදුලිබල මණ්ඩලය, නො. 09, නවනගරය, රත්නපුර. |
| 119 | එච්.බී.එන්.ධනංජලී මිය | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට, | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගැටන්ගම, රත්නපුර. |
| 120 | දුමින්ද කුමාර මහතා | පළාත් අධ්‍යක්ෂ වෙනුවට | කර්මාන්ත දෙපාර්තමේන්තුව,සබරගමුව පළාත් සභාව |
| 121 | ලලිත් කුමාර මහතා, | ප්‍රාදේශීය කළමනාකරු වෙනුවට, | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, |
| 122 | ධර්ම ශ්‍රී හරිස්චන්ද්‍ර මහතා, | ඩිපෝ කළමනාකරු | ලංගම ඩිපෝව, බලන්ගොඩ. |
| 123 | ඩී.පි.සියාසිංහ මහතා, | අඩවි ආරක්ෂක, | වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලය, ශ්‍රී පලාබද්දල. |
| 124 | අරුණ විජේරත්න මහතා, | ස්ථානභාර නිලධාරි, | ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ලෙල්ලෝපිටිය. |
| 125 | අයි.ජයසිංහ මහතා, | කම්කරු නිලධාරි. | කම්කරු කාර්යාලය, ඇල්ලගෙවත්ත, කහවත්ත. |
| 126 | පි.ආර්.ඩී.එම්.ජයසූරිය මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී, | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ත කාර්යාලය, උඩවලව |
| 127 | සමන් ඉන්දික මහතා, | දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 128 | රුක්මල් විජේරත්න මහතා, | දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන නිලධාරි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 129 | එන්.එම්.යූ.ඩී.කේ. නාමල්ගම මහතා, | දිස්ත්‍රික් ප්‍රධානී, | පාරිභෝගික කටයුතු අධිකාරිය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 130 | ඩබ්.ජී.ආර්.කුමාරසිරි මහතා | ජාතික ළමා රක්ෂක අධිකාරිය, | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 131 | නිමල් අබේරත්න මහතා | දිස්ත්‍රික් කළමනාකරු | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 132 | ගිහාන් පෙරේරා මහතා | කලාප නිලධාරී | ශ්‍රී ලංකා හදබිම් අධිකාරිය |

| අනු අංකය | නම. | තනතුර | ආයතනය/ දෙපාර්තමේන්තුව. |
|---|---|---|---|
| 133 | එච්.ඒ.වී.එන්.එස්.හපුආරච්චි මහතා, | වනජීවී අඩවි ආරක්ෂක වෙනුවට | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සීලගම, බෙලිහුල්ඔය. |
| 134 | එස්.එම්.ඩී.එල්.ඒ.කුලසේකර මහතා | ඩිපෝ කළමනාකරු වෙනුවට | ලංගම ඩිපෝව, රත්නපුර. |
| 135 | එල්.ජී.ඩී.වීරසූරිය මහතා | ප්‍රවෘත්ති නිලධාරී | සබරගමුව පළාත් සභාව |
| 136 | එච්.ඩබ්.චන්ද්‍රානි මිය | සංවර්ධන නිලධාරී | පුරාවිද්‍යා කාර්යාලය, රත්නපුර |
| 137 | ඒ.පි චමිල කුමාර මහතා | ව්‍යාපෘති කළමනාකරු | කේ.ඩී.ඊබට් සමාගම |
| 138 | එන්.කේ.එස්.මායාදුන්න මහතා, | දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී.වෙනුවට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |
| 139 | බී.භාතිය ජයවීර මහතා | කළමනාකරණ සේවා නිලධාරී | මාධ්‍ය ඒකකය, සබරගමුව පළාත් සභාව |
| 140 | කේ.එම්.එස්.ජයවර්ධන මහතා | මාධ්‍ය ලේකම් | ආණ්ඩුකාර කාර්යාලය, සබරගමුව පළාත් සභාව |
| 141 | එම්.පී.මධුෂාන් මහතා | කැමරා ශිල්පී | මාධ්‍ය ඒකකය, සබරගමුව පළාත් සභාව |

06. නොපැමිණීම්:-

| අනු අංකය | නම | තනතුර | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව / ආයතනය |
|---|---|---|---|
| 1 | වෛද්‍ය කේ.බී.කන්නන්ගර මහතා | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය රත්නපුර , |
| 2 | එස්.කුරුප්පු ආරච්චි මහතා | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 3 | ජී.ඩී.සුරංග ප්‍රදීප් කුමාර මහතා | ප්‍රාදේශීය ලේකම්, | අයගම , |
| 4 | ප්‍රසංග උදයකාන්ත මහතා | ප්‍රාදේශීය ලේකම් , | ඇඹිලිපිටිය |
| 5 | ජේ.එම්.ඩී.ජේ.බණ්ඩාර මිය | පළාත් කෘෂි කර්ම අධ්‍යක්ෂ, | පළාත් කෘෂි කර්ම අධ්‍යක්ෂ කාර්යාලය |
| 6 | එම්.ඒ.එන්. ප්‍රියදර්ශනි මිය | ස්ථානභාර නිලධාරි , | ජාතික කෞතුකාගාරය, රත්නපුර |
| 7 | ජී.කේ.එන්.තත්සරණි ගල්ඔළුව මිය | සහකාර අධ්‍යක්ෂ , | කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |

07. පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම:-

ප්‍රථමයෙන්ම දිස්ත්‍රික් ලේකම්/දිසාපති විසින් රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමන් ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. එසේම පළාත් සභා හා පළාත් පාලන ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා,වරාය හා ගුවන්සේවා ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා, රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මැතිතුමා, රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ලියනගේ මැතිතුමා , ගරු නගරාධිපති ඇතුළු පළාත් පාලන ආයතන ප්‍රධානීන්, ප්‍රධාන ලේකම් හා පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු නිලධාරීන්, නියෝජ්‍ය පොලිස්පති, පොලිස් අධිකාරි ඇතුළු ආරක්ෂක අංශයේ නිලධාරීන්, ප්‍රාදේශිය ලේකම්වරුන් ඇතුළු සියලුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් මෙන්ම සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, රත්නපුර දිස්ත්‍රික් ගරු මැති/ඇමතිතුමලාගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් ද ඇතුළු කමිටුව සඳහා පැමිණි සියලුම නිලධාරීන් ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

ගරු ජනාධිපතිතුමා බලයට පත්වීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති ලෙස අකිල සාලිය එල්ලාවල මැතිතුමා පත් කිරීමෙන් පසුව පවත්වනු ලබන පළමු කමිටු රැස්වීම මෙය බවත් ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳව කමිටුව දැනුවත් කිරීමට අපේක්ෂිත බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. අනතුරුව කමිටුවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ගරු කමිටු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමාට ආරාධනා කරන ලදී.

තමා නැවතත් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති ලෙස පත් කිරීම සම්බන්ධයෙන් ඒ සඳහා කටයුතු කළ සියලු දෙනාටම ස්තුතිය පළ කරන බව අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මෙතෙක් ලබා දෙන ලද සහයෝගය

ඉදිරියටත් ලබා දෙන ලෙස දේශපාලන අධිකාරියෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගෙන් ගරු සභාපතිතුමා ඉල්ලීමක් කරන ලදී,

**පසුගිය කමිටු වාර්තාව සභා සම්මත කිරීම - පසුගිය කමිටු වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත විය.**

08. ගැටළු/කරුණු සාකච්ඡා කිරීම:-

| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 1 | **දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් - ඉදිරිපත් කිරීම - අධ්‍යක්ෂ( ක්‍රමසම්පාදන) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (ඇමුණුම් අංක 01 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.)**<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක විවිධ අමාත්‍යාංශ හරහා ලැබුණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. ඒ අනුව විවිධ අමාත්‍යාංශ හරහා ප්‍රතිපාදන ලැබුණද මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව අනුමත ව්‍යාපෘති වලින් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එම චක්‍රලේඛය නිකුත් වන විට නිමි ව්‍යාපෘති හා ගිවිසුම්ගතව අත් හැරිය නොහැකි අත්‍යාවශ්‍ය ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කරන ලද බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව ප්‍රධාන වැඩසටහන් වන විමධ්‍යගත අයවැය වැඩසටහන ,ගම සමග පිළිසඳරක් වැඩසටහන , ඌණ සංවර්ධන දහම් පාසල් සංවර්ධනය, ආගමික සිද්ධස්ථාන සංවර්ධන වැඩසටහන හා හරිත දැයක් ජාතික වැඩසටහන යන වැඩසටහන් පිළිබඳව විශේෂයෙන් ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී . | | |
| i | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන)**<br><br>ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳව කමිටුව දැනුවත් කිරීම.<br><br>**මේ අනුව සියලුම ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ග්‍රාමීය ආර්ථික හා පුනර්ජීවන කේන්ද්‍ර පිහිටුවා ඇති බව කමිටුව වෙත දන්වන ලදී. මෙම වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ග්‍රාමීය කමිටුවත්,ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය කමිටුවත්, දිස්ත්‍රික් මට්ටමින් ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ දිස්ත්‍රික් කමිටුවත් පිහිටුවීම කරනු ලබයි.** | **දිස්ත්‍රික් ලේකම්**<br>මෙහිදි ග්‍රාමීය ආර්ථිකය නංවාලීමට ලබාදෙන සානුබලයන් මොනවාද යන්න පිළිබඳව දේශපාලන අධිකාරියේ අවධානයට යොමු කරන ලදී.මේ වන විට ආහාර සුරක්ෂිතතා පවුල් හා මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් පිළිබඳ තොරතුරු රැස් කරන බවත් එම අය සඳහා සහනයන් සැලසීමට ගත හැකි පියවරයන් හඳුනා ගනිමින් සිටින බවත් වැඩිදුරටත් දන්වන ලදී. | |
| ii | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමා<br>පාසල් පද්ධතිය තුළ පවතින මන්දපෝෂණ තත්ත්වය විමසීමට ලක් කිරීම. | **ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**<br>මේ වන විට මන්දපෝෂණ මට්ටමේ අය හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එසේ හඳුනා ගැනීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බව කමිටුව වෙත දන්වන ලදී. | **ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය** |
| 2.1 | ප්‍රධාන අමාත්‍යාංශ වැඩසටහන ඉදිරිපත් කිරීම- ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය(ඇමුණුම් අංක 02 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.) | | |
| i | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති, අකිල සාලිය එල්ලාවල මැතිතුමා**<br>2021.06.14 දින ඇඹිලිපිටිය රෝහල ජාතික රෝහලක් බවට පත් කිරීමෙන් එහි සේවය කරන ලද සේවක සේවිකාවන් 57 දෙනෙකු අපහසුතාවයට පත් වී ඇති බැවින් ඔවුන් සඳහා සාධාරණයක් ඉටු කිරීම.<br><br>**2021.06.14 දින ඇඹිලිපිටිය රෝහල ජාතික රෝහලක් බවට පත් කරන ලදී. එහි සේවය කරන ලද සේවක සේවිකාවන් 57 දෙනෙකු 2021.06.21 වැනි දින ස්ථිර කරන ලද අතර 2021.06.17 නිකුත් කරන ලද කැබිනට් පත්‍රිකාව හා 2021.06.28 දින නිකුත් කරන ලද කැබිනට් තීරණය අනුව මෙම නිලධාරීන් හට එම රෝහලටම අනුයුක්ත කිරීමක් සිදු කළ නොහැක. එබැවින් ඔවුන්ට වෙනත් රෝහලක සේවයට යාමට සිදු වේ. මේ හේතු කොට ගෙන ඔවුන් මහත් අපහසුතාවයට පත්ව ඇති බව වැඩිදුරටත් සාකච්ඡා විය.** | ඒ අනුව 2021.06.17 නිකුත් කරන ලද කැබිනට් පත්‍රිකාව හා 2021.06.28 දින නිකුත් කරන ලද කැබිනට් තීරණය හා ඔවුන් ස්ථිර කරන ලද දිනය පිළිබඳ ව සළකා බලා යම් සාධාරණයක් ඉටු කිරීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තීරණය කරන ලදී. | **දිස්ත්‍රික් ලේකම්** |

| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 2.1 | **පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වැඩසටහන- ඉදිරිපත් කිරීම- ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය (ඇමුණුම් අංක 02 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.)** | | |
| i | **පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා**<br>අයගම රාහුල විද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය පසුබෑමකට ලක්වීම හේතුකොට ගෙන එම පාසලේ එක් සිසුවකුට හෝ විශ්ව විද්‍යාල අධ්‍යාපන වරම් ලබා ගැනීමට නොහැකිවීම. මෙවැනි පාසල් සඳහා සුදුසු විදුහල්පතිවරුන් පත් කිරීම. | **ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**<br>මෙවැනි පාසල් හඳුනා ගනිමින් පවතින අතර ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කරන බව කමිටුව වෙත දන්වන ලදී. | **ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය** |
| ii | රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ලියනගේ මැතිතුමා<br>පහ වසර සමත් වීමෙන් පසු අ.පො.ස සා/පෙ. දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා අ.පො.ස උසස් පෙළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හැදෑරීමට සීමිත පාඨශාලාවන් ප්‍රමාණයක් පැවතීම ගැටළුවක් බව විසින් දන්වන ලදී.<br><br>**ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**<br><br>රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් තුනක (ද්විභාෂා) පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් පෙළ අධ්‍යාපන කටයුතු සිදු කරන බවත් ගුරු පුරප්පාඩුව හේතුවෙන් පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂය ධාරා හැදෑරීමට නොහැකි වී ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී . එසේම සිංහල මාධ්‍ය උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සඳහාද ගරු පුරප්පාඩු ඇති බවත් ප්‍රකාශ කළ අතර කෙසේ වෙතත් ගුරුවරුන් බඳවා ගැනීමට මේ වනවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට යවා ඇති බව ප්‍රකාශ කරන ලදී .<br><br>**මෙම කාල සීමාව තුළ ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බැවින් කාර්යාලවල රැඳී සිටින අතිරික්ත සංවර්ධන නිලධාරීන්ගෙන් සුදුසුකම් සහිත අය ගුරු සේවයට අන්තර් ග්‍රහණය කිරීම තුළින් සංවර්ධන නිලධාරීන් යම් මට්ටමක තුලනය කිරීමට හැකි වන බවට සාකච්ඡා විය.**<br>**මෙහිදී ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලද්දේ මේවන විට පළාත් සභාව මගින් ඉල්ලුම්පත් කැඳවා තිබුණද ඉදිරි කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබාදී නොමැති බවයි. එසේම බඳවා ගෙන ඇති බොහෝ නිලධාරින් මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් නොමැති බව වැඩිදුරටත් දන්වන ලදී.**<br><br>**එසේම ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව ගුරු සේවයට ඇතුළත් වීමට වයස අවු 35ට අඩු විය යුතුය යන කාරණය හේතුවෙන් අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරින් හට ගුරු සේවයට ඇතුළත් වීමට නොහැකි වී ඇති බවට කරුණු අනාවරණය විය.** | ඒ අනුව දැනට උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ සේවයෙහි පිහිටුවා ඇති සංවර්ධන නිලධාරීන් සඳහා වයස් සීමාව සම්බන්ධයෙන් යම් සාධාරණයක් කිරීමටත්, සුදුසුකම් සහිත නිලධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තීරණය කරන ලදී. | **ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව/ ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ දිස්ත්‍රික් ලේකම්** |
| iii | රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මැතිතුමා<br>රටේ දැඩි ආර්ථික අර්බුදයක් පවතින කාලවකවානුවේදී පාසල් වල සේවය කරන සුළු සේවකයින් ස්ථාන මාරු කිරීම හේතුවෙන් එම සේවකයින් මහත් අසීරුතාවයකට පත්වී ඇත. එබැවින් ඔවුන් සඳහා ආසන්න ස්ථානයක් ලබාදීම.<br>**ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**<br><br>මෙම ස්ථාන මාරු කිරීම තාවකාලිකව නවතා ඇත. 2021 ස්ථාන මාරු පටිපාටිය අනුව මෙම ස්ථාන මාරු කිරීම් සිදුකරන ලද්දක් බවත් එය වසර 13කට පසු සිදුකිරීමෙන් මෙවැනි තත්ත්වයක් පැන නැගී ඇති බව කමිටුව වෙත දන්වන ලදී.<br>කෙසේ නමුත් මෙම නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදුකළ යුතු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී එසේම මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් මේ වන විට අභියාචනා ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙන ලදී. | එම අභියාචනා හා රටේ පවතින වර්තමාන ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගනිමින් විධිමත් ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරුවීම් සිදු කරන ලෙස කමිටුව විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී. | **ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව/ ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය** |

| | | | |
|---|---|---|---|
| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
| 3.1 | **ඉඩම්, කෘෂිකර්ම අමාත්‍යාංශ වැඩසටහන -ඉදිරිපත් කිරීම - ලේකම් පළාත් ඉඩම්, කෘෂිකර් අමාත්‍යාංශය (ඇමුණුම් අංක 02 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.)** | | |
| i | **පළාත් සභා හා පළාත් පාලන ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා**<br>කොරියානු ආධාර යටතේ ක්‍රියාත්මක වන සේමාවුල් ව්‍යාපෘතිය ග්‍රාමීය ආර්ථිකය නැංවීමේ අරමුණින් කරන ලද වැඩසටහනක් වුවද ප්‍රතිලාභීන් හට නිවැරදිව ප්‍රතිලාභ ළඟාවීමක් සිදු නොවන බව දැන්වීම.<br>**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)**<br>මීට වසර කිහිපයකට පෙර කොරියානු රජයේ ආධාර යටතේ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වේ. පවතින මූල්‍යමය අර්බුදයත් සමගම භාණ්ඩාගාරය විසින් නිකුත්කරන ලද චක්‍ර ලේඛයට අනුව එයට අදාළ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම භාණ්ඩාගාරය හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත බවට කමිටුව වෙත දන්වන ලදී. ඒ සඳහා පළාත් සභාව හරහා ප්‍රතිපාදන ලැබේ නම්, දැනට කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කය තුළ සිදු කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් ලැබී ඇති බව වැඩිදුරටත් දන්වන ලදී. | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ක්‍රමසම්පාදන), සබරගමුව පළාත් සභාව**<br>ප්‍රතිලාභීන් වෙත ලැබෙන ප්‍රතිලාභවලට වඩා කාර්ය මණ්ඩලය හා වාහන සඳහා අධික මුදලක් වැය වන බව සාකච්ඡා වූ අතර මේ සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කරන ලෙසට ඉල්ලා ඇති බව දන්වන ලදී . | **ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව** |
| 4.1 | **සමාජ සේවා අමාත්‍යාංශ වැඩසටහන ඉදිරිපත් කිරීම - ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය (ඇමුණුම් අංක 02 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.)** | | |
| i | **රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ලියනගේ මැතිතුමා**<br>දුරබැහැර ප්‍රදේශවල සිටින වැඩිහිටි හා ආබාධිත දීමනා ලබන පුද්ගලයින් එම දීමනා ලබාගැනීම සඳහා සමෘද්ධි කලාප කාර්යාලය වෙත යාමට සිදු වීමෙන් ඔවුන් මහත් අපහසුතාවයට පත් වී ඇති බවත්, එම දීමනාව වෙනත් පහසු ස්ථානයකින් (ගම් මට්ටමින්) ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා ලදී. | **දිස්ත්‍රික් ලේකම්**<br>රටේ පවතින ආර්ථික තත්ත්වය තුළ මේ වන විට සමාජ ප්‍රතිලාභ මණ්ඩලය මගින් සමාජ සුබසාධන යටතේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු කරමින් පවතින බවත් ඒ සඳහා අඩු ආදායම්ලාභීන්, සමෘද්ධිලාභීන්, පොරොත්තු ලේඛනගත පුද්ගලයින් හඳුනා ගනිමින් පවතින බව කමිටුව වෙත දන්වන ලදී. ඉදිරියේදි ඔවුන් සඳහා ලබාදෙන සියලුම දිමනා සමෘද්ධි බැංකු හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බැවින් මේ වන විට ගෙන ඇති එම තීරණය වෙනස් කිරීමේ හැකියාවක් නොමැති බව කමිටුව වෙත දන්වන ලදී. නමුත් මෙලෙස හඳුනා ගැනීම්වලින් අනතුරුව ඉදිරියේදී ඒ පිළිබඳව ජාතික මට්ටමින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අවධානය යොමු කරවන බව කමිටුව වෙත දන්වා සිටින ලදී. | |
| 5.1 | **පළාත් මාර්ග අමාත්‍යාංශ වැඩසටහන . - ඉදිරිපත් කිරීම - ලේකම්, පළාත් මාර්ග අමාත්‍යාංශය (ඇමුණුම් අංක 02 යටතේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.)** | | |
| i | I-ROAD ව්‍යාපෘතිය මගින් කරන ලද ව්‍යාපෘති වල මාර්ග උරහිස් (shoulder) සාදා නොමැති වීමෙන් මාර්ග දැඩි ලෙස අබලන් වීම<br>**පළාත්භාර අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය**<br>**එම ව්‍යාපෘතිය විසින් කරන ලද මාර්ග වල ඉදිකිරීම් අවසන් කර ඇති ප්‍රමාණය රථ වාහන ධාවනයට හැකිවන පරිදි නඩත්තු කර ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අදාළ ආයතන වෙත ලබාදීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී .**<br>**මෙම මාර්ග එලෙස බාර ගැනීමේ එකඟතාවය පිළිබඳ පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් කමිටුව විසින් විමසීමක් කරන ලදී.** | **ලේකම්, පළාත් මාර්ග අමාත්‍යාංශය**<br>මාර්ග ධාවනයට සුදුසු පරිදි නඩත්තු කිරීමෙන් අනතුරුව භාර ගැනීමට පළාත් මාර්ග අමාත්‍යාංශයේ එකඟතාවය පළ විය. පවතින ප්‍රතිපාදන තුළ මාර්ග දෙපස එළිපෙහෙලි කිරීම හා මාර්ග නඩත්තු කර ගෙන යාම කළ හැකි බව මෙහිදී ප්‍රකාශ කරන ලදී. | **ලේකම් පළාත් මාර්ග අමාත්‍යාංශය / පළාත් භාර අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය** |

| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 6 | **ඩෙංගු මර්දන ජාතික වැඩසටහන හා ලෝක ව්‍යවසනයක්ව පවතින කොරෝනා (COVID -19) වසංගත තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම . ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ**<br>2022 වර්ෂයේ අගෝස්තු දක්වා ඩෙංගු රෝගීන් 1773ක් හා මරණ 5 ක් වාර්තා වී ඇත. රත්නපුර නගරය ,ඇලපාත , ඇහැලියගොඩ , ඇඹිලිපිටිය , කුරුවිට යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස අවදානම් තත්ත්වයට පත්ව ඇති බව ප්‍රකාශ කරන ලදී. අදාළ ආයතන එක්ව ඩෙංගු මර්දන වැඩසටහන් හා මේ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව වැඩිදුරටත් දන්වන ලදී . ඩෙංගු මර්දනය සඳහා දුමායනය කිරීමට වඩා කීට මර්දනය සාර්ථක ක්‍රමයක් බවත් ඒ සඳහා අවධානය යොමු කර ඇති බව කමිටුව වෙත දන්වන ලදී. | | **ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර** |
| 7 | **විශාල මුදලක් වැය කරමින් කඩුවෙල ප්‍රදේශයේ පවත්වාගෙන යන මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සඳහා සබරගමුව පළාත් සභාවේ ගොඩනැගිල්ලක් ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම .**<br>මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සභාපතිගේ අංක GJRTI/ADHR/CL/05 හා දිනැතිව ලිපිය මගින් 2022.05.05 කොළඹ ප්‍රදේශයේ එම ආයතනය තිබීමේ අවශ්‍යතාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇති බව ගරු කමිටු සභාපතිතුමන් විසින් කමිටුව වෙත දන්වන ලදී. | | |
| | කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ලිපි | | |
| 8 | **කුඩා ජල විදුලි බලාගාරවල ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධයෙන් සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත යොමු කරන ලද අංක SMRE/DEV/02/67/2022 හා 2022.03.14 දිනැති ලිපිය**<br><br>**2021.02.16 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කුඩා ජල විදුලි බලාගාරවල ගිවිසුම් අලුත් කිරීමේදී සමාගම් විසින් ඇතැම් පළාත් පාලන ආයතන වෙත ගෙවීම් කරන බවත් ඇතැම් පළාත් පාලන ආයතන වෙත ගෙවීම් නොකරන බවත් සාකච්ඡා වූ බැවින් මේ සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීමට එවකට පැවති විදුලි බල අමාත්‍යාංශය වෙත යොමු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ගෙවීම් පැහැර හැර ඇති කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් තොරතුරු සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යොමු කරන ලෙස එම අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබූ අතර ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇරැපොල සමනල කුඩා ජල විදුලි බලාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත දන්වා ඇත.**<br><br>**කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඩා ජල විදුලි බලාගාර අයත් එක් සමාගමක් විසින් ගිවිසුම් අලුත් කිරීමේදී පළාත් පාලන ආයතනය වෙත ඒකකයක් සඳහා ඉතා සුළු මුදලක් ගෙවීම් කරන බවත් අනෙක් සමාගම් ගෙවීම් නොකරන බවත් සාකච්ඡා විය. කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් සමාගම් හා කරන ලද සාකච්ඡාවේදී ගෙවනු ලබන ගාස්තුව ඉහළ දැමීම හා ගාස්තු නොගෙවන සමාගම් ගෙවීම් කිරීමටත්, එම සමාගම් විසින් එකඟතාවය පළ කළ බැවින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සුදුසු බව කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් කමිටුව වෙත දන්වන ලදී.** | මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ද එම කාරණය සාකච්ඡා කරන ලදී. එබැවින් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කමිටුව දැනුවත් කිරීම සඳහා එවන මෙන් එම අධිකාරිය වෙත දන්වා යැවීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණය විය. | **දිස්ත්‍රික් ලේකම්** |

**10.** කමිටු යෝජනා

| අනු අං කය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 10.1 | **විදුලි ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු** | | |
| | **ඕපනායක ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව - ප්‍රාදේශීය ලේකම්** | | |
| 1 | ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩි අවදානම් නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන උතුරු හුණුවල ග්‍රාම නිලධාරී වසමේ ඉඹුල්තැන්න රජයේ ඉඩම් සඳහා නව විදුලිය සැපයුම් පද්ධතියක් ලබා ගැනීමට ලංකා විදුලි බල මණ්ඩලයේ නියෝජ්‍ය සමානාධිකාරී (සබරගමුව) වෙත කරන ලද ඉල්ලීම සඳහා මෙතෙක් විසඳුම් නොලැබීම.<br><br>**රත්නපුර පළාත් ඉංජිනේරු ඒකකය මගින් විදුලිය ලබාදීම සම්බන්ධ කටයුතු සිදු කරන අතර මේ වන විට ලංකා විදුලි බල මණ්ඩලය හා රටේ පවතින ආර්ථික සහ මූල්‍යමය ගැටළු නිසාවෙන් කාර්යය සිදු කිරීමේදී අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟවීම හේතුවෙන් පොදු ජනතාවගේ මෙවැනි ගැටළුවලට විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය මහත් අපහසුතාවයට පත්ව ඇති බව කමිටුව සඳහා සහභාගි වූ ඉංජිනේරු සහකාර විසින් දන්වන ලදී.** | එබැවින් මේ සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය විය. | **දිස්ත්‍රික් ලේකම්**<br><br>**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, විදුලිබල මණ්ඩලය** |
| 2 | 2017 නාය අඩි අවදානම් තත්ත්ව යටතේ නැවත පදිංචි කළ සහ නැවත පදිංචි කළ යුතු පවුල් සඳහා නව විදුලි සැපයුම ලබාදීමේදී මුදල් අය නොකර පෙර පැවති මනුව සහනාධාර ක්‍රමවේදය යටතේම කඩිනමින් සවිකර දීමට කටයුතු කිරීම | සහනාධාර ක්‍රමය යටතේම පැරණි විදුලි සැපයුම් අදාළ නව නිවාස සඳහා ලබාදීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කිරීම සුදුසු බව දිස්ත්‍රික් කමිටුවේ තීරණය විය. | **දිස්ත්‍රික් ලේකම්** |
| 10.2 | **ඉඩම් ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු** | | |
| | **රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී මුදිතා ප්‍රිශාන්ති ද සොයිසා මැතිතුමිය** | | |
| i | ගොඩකවෙල කොස්නාතොට ප්‍රදේශයේ ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දීර්ඝ කාලයක් පැරණි අබලන් තත්ත්වයේ පවතින නිල නිවාස ද සහිත ඉඩම ගොඩකවෙල ශ්‍රී ලංගම ඩිපෝව ස්ථාපිත කිරීමට හා මේ වන විට ශ්‍රී ලංගම ඩිපෝව පිහිටි ස්ථානයේ ගොඩකවෙල බස් නැවතුම්පල ඉදිකිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීම<br><br>**අක්කර 3ක පමණ වපසරියකින් යුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් මෙම ඉඩම් කොටසෙහි නිල නිවාස 5 කින් හා පොල් වගාවකින් සමන්විතය. එහි ගොඩනැගිලි 02 ක් මේ වන විට ඇල්ලවැව ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇති බව වාරි මාර්ග ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී.**<br><br>ප්‍රාදේශිය කළමනාකරු, ලංකා ගමනා ගමන මණ්ඩලය<br><br>**මෙම ඉඩම පිළිබඳව ශ්‍රී ලංගම ගොඩකවෙල ඩිපෝව දැනුවත්ව නොමැති බවත්, දැනට හඳුනාගෙන ඇති ඉඩම ඒ සඳහා යෝග්‍යද යන්න පරීක්ෂා කළ යුතු බව කමිටුව වෙත දන්වන ලදී.** | ගොඩකවෙල ශ්‍රී ලංගම ඩිපෝව ස්ථාපිත කිරීමට සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩම ලබාදීමේ හැකියාව සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් කිරීමට සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණය විය. | **දිස්ත්‍රික් ලේකම්** |

| අනු අං කය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 10.3 | **ජලසම්පාදනය ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු** | | |
| | **රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ප්‍රියන්ත ලියනගේ මැතිතුමා** | | |
| i | දැඩි පානීය ජල අර්බුදයකට මුහුණදී සිටින ඇලපාත, පලාවෙල, කොටාමුල්ල, හංගමුව සහ කරංගොඩ ප්‍රදේශ සඳහා විසල් රත්නපුර හෝ වෙනත් ජල ව්‍යාපෘතියක් මගින් පානීය ජලය ලබා දෙන ලෙසට යෝජනා කිරීම.<br>**ස්ථානභාර නිලධාරී, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**<br>නව ජල ව්‍යාපෘති 24 ක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර පළමු අදියර අවසන් කර ඇත. දෙවන අදියර යටතේ ඉදිකිරීම් සිදු කිරීමට නියමිත ඇත. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල (මිලියන 3000) පමණ වන බවත් අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීමෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇති බව කමිටුව වෙත දන්වන ලදී.<br>**මේ සඳහා ඇස්තමේන්තුගත මුදල (මිලියන 3000) වන බැවින් කොටස් වශයෙන් සිදු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් කමිටුවේදී සාකච්ඡා විය.**<br>**එසේම අමුවල ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් විසින් නල එළා ටැංකි සවිකර සියලු කටයුතු අවසන් කර ඇතත් තවමත් ජනතාවට ජලය ලබා දී නොමැති ව කටයුතු නතර වී ඇති බව ප්‍රකාශ කරන ලදී.** | **ස්ථානභාර නිලධාරී, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**<br>මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම හා මේ වන විට ජලය ක්ලෝරීන් කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදු වන බැවින් එම කරුණු කෙරෙහි දේශපාලන අධිකාරියේ අවධානය යොමු කරවන ලදී.<br>**ස්ථානභාර නිලධාරී, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**<br>එම ව්‍යාපෘතිය ප්‍රජා ජල ව්‍යාපෘතිය හරහා සිදු කරන ලද ව්‍යාපෘතියක් නොවන බැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා ඉදිරි කටයුතු සිදු කරන බව කමිටුව වෙත දන්වන ලදී. | **ස්ථානභාර නිලධාරී, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව** |
| 2 | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුකුළුගල ආපදා ගම්මානයේ ජනතාවට ජලය ලබා දීම සඳහා ආරම්භ කළ ජල ව්‍යාපෘතියේ අඩුපාඩු සම්පූර්ණ කර කඩිනමින් එම ජනතාවට ජලය ලබා දෙන ලෙසට යෝජනා කිරීම.<br>දිස්ත්‍රික් කළමණාකරු, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>**පිරිපහදු මධ්‍යස්ථානය ,පොම්පාගාරය (ප්ලාන්ට්) ඉදිකිරීම් අවසන් බවත් තුමුළුව හා ප්‍රවේශ මාර්ගයෙහි (ඉන්ටෙක්) ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ඉඩම් ගැටළුවක් ඇති නිසාවෙන් නැවතී ඇති බවත් ඒ සඳහා විකල්ප ස්ථානය සඳහා ඉඩම සඳහා ලිඛිත අවසරය ලැබුණු පසු ක්‍රියාත්මක කළ හැකි බව දන්වන ලදී.** | **ප්‍රාදේශීය ලේකම් , නිවිතිගල**<br>හඳුනාගෙන ඇති ඉඩමෙහි අනවසරකරුවෙකු පදිංචිව සිටින අතර ඔහුගෙන් එල්ලවූ විරෝධතාවය හේතුවෙන් නෙරපීමේ නියෝගයක් ලබා ගෙන ඇත. ඒ සම්බන්ධයෙන් ඔහු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා හේතුවෙන් දැනට නඩු කටයුත්තක් ක්‍රියාත්මක වේ. මේ සඳහා යෝජිත විකල්ප ස්ථානය අනවසරකරු පදිංචි ඉඩමෙහි කොටසක අතර මෙම අවස්ථාවේ නඩු කටයුත්තක් පවතින බැවින් එහි තීරණය ලැබෙන තුරු ඉදිකිරීම් නොකරන ලෙසට නීතිඥවරයාගෙන් උපදෙස් ලැබී ඇති බවත් දන්වා සිටි අතර ඉදිරි නඩු දිනය 2022.10.05 බවත් විසින් වැඩිදුරටත් දැන්වීය. | **ප්‍රාදේශීය ලේකම් , නිවිතිගල**<br><br>දිස්ත්‍රික් කළමණාකරු, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| 3 | ගරු සභාපති ප්‍රාදේශීය සභාව, කුරුවිට<br>කුරුවිට කුඩා ජල ව්‍යාපෘතිය මගින් පවුල් 2500 ක් පමණ ප්‍රතිලාභ ලබන අතර මේ වන විට ජල ධාරිතාව ප්‍රමාණය ද අඩු වී ඇත. එබැවින් මලව දක්වා විසල් රත්නපුර ව්‍යාපෘතිය හරහා ජලය ලබා ලබාදීම. | **ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලය**<br>කුරුවිට පැරඩයිස් දක්වා මේ වන විට ජලය ලබාදීමේ කටයුතු කරමින් පවතින අතර ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රමාද වී ඇත. එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව මලව දක්වා ලබාදීමට කටයුතු කරන බව ජලසම්පාදන මණ්ඩලය ප්‍රකාශ කරන ලදී. | |
| 4 | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව කුරුවිට<br>**විසල් රත්නපුර ව්‍යාපෘතිය මගින් ජල නල එළීමේදී පලුදු කරන ලද මාර්ග පිළිසකර කිරීම සඳහා පළාත් පාලන ආයතන සඳහා මුදල් ලබානොදීම.**<br>විසල් ජල ව්‍යාපෘතිය යටතේ කුරුවිට පරකඩුව මාර්ගය ජල නල එළීම සඳහා පලුදු කර ඇති අතර, මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් කුරුවිට පළාත් පාලන ආයතනය වෙත රු.මි. 20 ක පමණ මුදල් ලබාදී නොමැති බව කමිටුවේදී සාකච්ඡා විය. ලෝක බැංකු ණය ගිවිසුම අනුව බැංකුව හරහා අදාළ කොන්ත්‍රාත් සමාගම වෙත මුදල් ලබාදීම සිදුවන බවත් ඔවුන් මගින් පළාත් පාලන ආයතනය වෙත මුදල් ලබාදීමට දන්වා ඇති බවත් වැඩිදුරටත් සාකච්ඡා විය. | පළාත් පාලන ආයතන හා කොන්ත්‍රාත්කරුවන් අතර කිසිදු ගිවිසුමක් නොමැති බැවින් ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය මැදිහත්වී අදාළ පළාත් පාලන ආයතනය වෙත කඩිනමින් මුදල් ලබාදීමටත් ඉදිරියේදී මෙම ගැටළුව විසඳා ගැනීම සඳහා අදාළ ගිවිසුම සංශෝධනය කළ යුතු බව දිස්ත්‍රික් කමිටුවේ තීරණය කරන ලදී. | **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය** |

| අනු අං කය | සාකච්ඡා කළ ගැටළුව/කාරණය | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| 10.04 | ආගමික හා සංස්කෘතික, සමාජ සුබ සාධන ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු | | |
| | නාගරික කොමසාරිස්- මහා නගර සභාව, රත්නපුර | | |
| 1 | හිදැල්ලන කරපිංච පාර ආසන්නයේ නාගරික බල ප්‍රදේශයේ පිහිටා ඇති දැනට වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් භුක්ති විදිනු ලබන ප්‍රාදේශීය ලේකම්ට අයත් ක්‍රිඩාපිටිය සහ කුඩා ප්‍රජා ශාලාව ප්‍රදේශවාසීන්ට ප්‍රයෝජනයට ගත නොහැකි පරිදි වල් බිහිවී අබලන්වී ඇත. එම ස්ථානය සංවර්ධනය කර මහජන සේවයට පත් කිරීම සඳහා මහා නගර සභාවට පැවරීම.<br>**ප්‍රාදේශීය ලේකම්, රත්නපුර**<br>ආනන්ද විද්‍යාලයේ ක්‍රීඩා පිටිය ලෙස මෙය භාවිතා කරයි. ඉදිරියේ දී සීමා නීර්ණයෙන් වෙන් වන නව නගර වසමට අදාළව සේවා පියස ඉදි කිරීමට ඇති එකම ස්ථානය මෙය බැවින් ප්‍රාදේශීය ලේකම් යටතේ තබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ප්‍රතිපාදන නොමැති කමින් දැනට ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීමට නොහැකි වී ඇති බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.<br>වාරිමාර්ග ඉංජිනේරු, රත්නපුර<br>දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා හා ආනන්ද විද්‍යාලයේ කටයුතු සඳහාද මෙය භාවිතා කරන බැවින් එලෙසම පැවතීම සුදුසු බවට අදහස් දක්වන ලදී. | මේ අනුව මෙම කාරණය දීර්ඝ ලෙස සාකච්ඡා කළ යුත්තක් බැවින් අනුකමිටුවක් තුළ සාකච්ඡා කර තීරණයකට එළඹීම සුදුසු බව කමිටුවේ ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් කමිටුව වෙත දන්වන ලදී. | **දිස්ත්‍රික් ලේකම්**<br>**ප්‍රාදේශීය ලේකම්**<br>**නාගරික කොමසාරිස්** |
| 11 | පහත සඳහන් සංවර්ධන යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම | | |
| 1 | රත්නපුර දිස්ත්‍රික්කය පාසල් තුළ ක්‍රිඩා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ර/ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය නම් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | මේ සඳහා කමිටුවේ අනුමැතිය හිමි විය. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| 12 | **පසුව ලැබුණු යෝජනා** | | |
| 1 | **ඉඩම් ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු** | | |
| | රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමා | | |
| i | සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් සිංහරාජ ප්‍රවේශ මාර්ගයට ආසන්නයෙන් පොලිස් සංචාරක ඒකකයක් ස්ථාපිත කිරීමට නියමිතය.ඒ සඳහා දැනට ර/නිවි/කුඩව විද්‍යාලය විසින් භුක්ති විදිනු ලබන ඉඩම් කැබැල්ලේ කැබලි අංක 517,521,522 යන බිම් කොටස සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දීම.<br>ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා වසා දමා ඇති ගොවි සෙවන කාර්යාලය මේ සඳහා ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විමසීමට ලක් කිරීම.<br>දිසා වන නිලධාරී , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>දැනට ගොවි සෙවන කාර්යාලය අලුත්වැඩියා කර සංචාරක වන නිවහන ලෙස භාවිතා කරන බවත් දැනට එය හොඳ තත්වයේ පවතින පවසන ලදී. | 521, 522 බිම් කොටස් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා දීමට කටයුතු කරමින් පවතින අතර පාසලෙන් පරිබාහිරව පවතින 517 කොටස ලබාදීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට නියමිත බව කලවාන ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | **ලේකම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ ප්‍රාදේශීය ලේකම්,කලවාන /ශ්‍රී ලංකා පොලිසිය, කලවාන** |

| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුවකාරණය/ | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| | **අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, රත්නපුර** | | |
| ii | රත්නපුර ශික්ෂණ රෝහල් ඉඩම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීම<br>**රෝහල භූමිය හරහා භාවිතා කරන මාර්ග වෙනුවට විකල්ප මාර්ග ලබාදීමට එකඟ වී ඇති බව රෝහල් අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී . එසේම රෝහල ඉදිරිපස පිහිටි අනවසර වෙළඳසැල් සහිත භූමිය හැර (ගැටළු සහිත කොටස හැර) ඉතිරි කොටස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීමට යෝජනා කරන ලදී. එම අනවසර වෙළඳසැල් ප්‍රාදේශීය ලේකම් භාරයේ තබා ගෙන හෝ නගර සභාව වෙත පවරා සුදුසු සංවර්ධන කටයුත්තක් යොදා ගැනීම සුදුසු බව රෝහල් අධ්‍යක්ෂ විසින් කමිටුව වෙත දන්වන ලදී.<br>මෙහිදි ප්‍රාදේශීය ලේකම් කියා සිටියේ ප්‍රාදේශීය ලේකම් භාරයේ තබා ගෙන දීර්ඝ කාලීනව හෝ වාර්ෂික බදු පදනම මත මෙම රෝහල ඉදිරිපස ඉදිකර ඇති අනවසර වෙළඳසැල් ලබාදීමේ හැකියාව පවතින බවත් එසේ නොමැති නම් නගර සභාව වෙත පවරාගෙන යම් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් පවතින බවයි.** | ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කළ යුතු කරුණක් බැවින් අනුකමිටුවක් තුළ සාකච්ඡා කර තීරණයකට එළඹීම සුදුසු බව කමිටුව විසින් තීරණය කරන ලදී. එය 2022.10.11 දින ප.ව 2.00 ට පැවැත්වීමට කමිටුව විසින් සැලසුම් කරන ලදී . | **දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, රත්නපුර අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, රත්නපුර නාගරික කොමසාරිස්,** |
| 2 | **මාර්ග ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු** | | |
| | වරාය හා ගුවන් සේවා ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා | | |
| i | කොළඹ සිට අවිස්සාවේල්ල,රත්නපුර, පැල්මඩුල්ල, ඇඹිලිපිටිය හරහා හම්බන්තොට දක්වා මාර්ගය යම් යම් ස්ථාන වල මේ වන විට දැඩි ලෙස අබලන් ව ඇති බැවින් මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් ඉදිරියේදී මංතීරු 04 ක් සහිතව මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසත් යෝජනා කිරීම.<br>**මෙම මාර්ගයෙහි සංවර්ධන කටයුතු කොන්ත්‍රාත් සමාගම් 04ක් යටතේ සිදු කිරීමට I – ROAD ව්‍යාපෘතියට භාර දී තිබුණද ප්‍රමාද ව ප්‍රතිපාදන ලැබීම හේතුවෙන් එහි නඩත්තු කටයුතු ප්‍රමාද වූ බවත් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීමට උපරිම උත්සාහයක් ගන්නා බවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කමිටුවට දන්වන ලදී. මේ වන විට පවතින ඉන්ධන අර්බුදය හා අමු ද්‍රව්‍ය මිල උච්චාවචනය හේතුවෙන් සංවර්ධන කටයුතු කිරීමට නොහැකි වී ඇති බවට කරුණු අනාවරණය විය.** | මෙහි සංවර්ධන කටයුතු සඳහා දිනකට එක කොන්ත්‍රාත් සමාගමකට ඩීසල් ලීටර් 500 බැගින් ලීටර් 2000ක් අවශ්‍ය බවත් එය සපුරා ගැනීමට හැකි නම්, මාර්ගයෙහි සංවර්ධන කටයුතු කිරීමට හැකි බවත් වැඩිදුරටත් සාකච්ඡා විය. මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති හෙයින් එය කඩිනමින් සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. | **දිස්ත්‍රික් ලේකම්, පළාත්භාර අධ්‍යක්ෂ ,මාර්ග සංවර්ධන අධිකාරිය** |
| ii | **ගරු සභාපති, ප්‍රාදේශීය සභාව, බලංගොඩ**<br>බලංගොඩ කල්තොට මාර්ගය සංවර්ධනය කිරීම. | මාර්ග සංවර්ධන අධිකාරිය<br>බලංගොඩ කල්තොට මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු ඉන්ධන අර්බුදය හේතුවෙන් මේ වන විට නවතා ඇති බවත් ඉන්ධන ගැටලු විසඳීමෙන් පසු මාර්ගයෙහි සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට හැකි බවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කමිටුව වෙත දන්වන ලදී | පළාත්භාර අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 3 | **පරිසර, වනජීවී හා වන රොද සංරක්ෂණය සම්බන්ධ ගැටළු** | | |
| | ගරු සභාපති, ප්‍රාදේශීය සභාව, බලංගොඩ | | |
| i | බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දහමාන, වීකිලිය, බෝවත්ත, මාවෙල, වටවල, මුල්ගම, දියවින්න, මහවලතැන්න, මැදබැද්ද, කල්තොට, ආදී ප්‍රදේශයන්හි පවතින වන අලි ගැටළුව<br>**වන අලි ගම්වැදීම හේතුවෙන් බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවිතවලට පවා තර්ජනයක් එල්ල කරමින් ජනතාව මහත් පීඩාවට පත්ව ඇති අතර අලි** | වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය මගින් අලි වැට ඉදිකිරීම ප්‍රමාද වන්නේ නම්, එම භාණ්ඩ පළාත් පාලන ආයතනය වෙත ලබාදී හෝ අලිවැට ඉදි කිරීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය විය. | **සහකාර අධ්‍යක්ෂ වනජීවී , කලාප කාර්යාලය අඩවි /(දකුණ) ,ආරක්ෂක කල්තොට** |

| | | | |
|---|---|---|---|
| | **වැට කඩිනමින් සකස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා විය. මේ වන විට අලි වැට සකස් කිරීම සඳහා අවශ්‍ය කණු හා උපකරණ වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය විසින් මිලදීගෙන ඇති බවට කමිටුව වෙත කරුණු ඉදිරිපත් විය . අමාත්‍යාංශයට එම ඉදිකිරීම් කඩිනමින් කළ නොහැකි නම්, පළාත් පාලන ආයතනය මගින් එම කනු යොදා අලිවැට ඉදි කිරීමේ හැකියාව පවතින බව කමිටුවේදී සාකච්ඡා විය.** | | |
| **අනු අංකය** | **සාකච්ඡා කළ ගැටළුවකාරණය/** | **ගන්නා ලද තීරණය** | **තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම** |
| | **වෙනත්** | | |
| I. | **වරාය හා ගුවන් සේවා ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා**<br>දැල වේ ගඟ ආශ්‍රිත අනවසර කැනීම් වැටලීම.<br>දැල වේ ගඟ ආශ්‍රිතව පිටස්තර කණ්ඩායම් විසින් කරනු ලබන අනවසර කැනීම් හේතුවෙන් පරිසර හානියක් සිදු වන බවත් මේ සම්බන්ධයෙන් ඇතැම් මාධ්‍ය හරහා එල්ල කරන ලද අසත්‍ය ප්‍රචාරණය හේතුවෙන් මැතිවරණ කොට්ඨාස භාර ගරු රාජ්‍ය අමාත්‍යවරයා ලෙස ප්‍රේමලාල් ජයසේකර මැතිතුමා මහත් අපහසුතාවයට පත්ව ඇති බවත් සාකච්ඡාවට ලක්විය .එසේම ගංගා වෙන්දේසි කර හා ගං ඉවුරු සංරක්ෂණය කර පරිසර විනාශය වළක්වා ගැනීමට කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කමිටුවෙන් ඉල්ලීමක් කරන ලදී.<br>වේ ගඟ වෙන්දේසි කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අවසරය ලබාදේ නම් එම කටයුතු කිරීමටත්, පරිසර හානිය වළක්වා, ගැනීමේත් වගකීම මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් භාර ගැනීමට හැකි බව එම ආයතනය විසින් ප්‍රකාශ කරන ලදී. | මෙම කරුණ පිළිබඳ විමසීම් කිරීමට එම අවස්ථාවේදී නියෝජ්‍ය පොලිස්පති හෝ පොලිසියේ වෙනත් සුදුසු නිලධාරියෙකුද රැස්වීමේ නොසිටි බැවින් මෙම අනවසර කැනීම් වටලන ලෙස නියෝජ්‍ය පොලිස්පති වෙත දැනුම්දීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.<br>එසේම වේ ගඟ වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවකදී සාකච්ඡා කර වෙන්දේසි කිරීම නතර කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් අදාළ ආයතන කැඳවා දීර්ඝ ලෙස සාකච්ඡා කර තීරණයකට එළඹීම සඳහා 2022.10.11 දින අනු කමිටුවක් කැඳවීමට තීරණය කරන ලදී. | **නියෝජ්‍ය පොලිස්පති**<br>**මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය** |
| II. | **ගරු සභාපති, බලංගොඩ ප්‍රාදේශීය සභාව**<br>වලවේ ගඟ ආශ්‍රිතව තම නිෂ්පාදන අලෙවි කිරීම් කටයුතු කරන කුඩා පරිමාණ අලෙවිකරුවන් හට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දින 3ක් ඇතුළත ඉවත් වන ලෙස දන්වා ඇති බැවින් ඔවුන්ගේ ජීවනෝපාය ලෙස ග්‍රාමීය නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු වල නිරත වීමට නොහැකිවී ඇත. මේ හේතුවෙන් ඔවුන්ගේ ආර්ථිකයට විශාල බලපෑමක් එල්ල වන බව කමිටුව වෙත දන්වන ලදී.<br>**පළාත්භාර අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය**<br>ආදායම් උත්පාදන වැඩසටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා සිදු කිරීමට නියමිත බැවින් ඒ සඳහා ඔවුන් සම්බන්ධ කරන ලෙස ප්‍රාදේශීය සභා ගරු සභාපති වෙත දන්වන ලදී | මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කිරීම සුදුසු බව කමිටුවේ තීරණය විය. | **ප්‍රාදේශීය ලේකම්, බලංගොඩ** |
| III. | **ගරු කමිටු සභාපති, අකිල සාලිය එල්ලාවල මැතිතුමා**<br>ගල් කැනීම සඳහා පුපුරණ ද්‍රව්‍ය නොමැති වීමෙන් ගල් කොරි පවත්වා ගෙන යාමට නොහැකි වීම.<br>**කලු ගල් කැනීම සඳහා (අමෝනියා) පුපුරණ ද්‍රව්‍ය නොමැතිවීමෙන් එම කර්මාන්තය කරගෙන යාමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව සාකච්ඡා විය.** | ඒ අනුව ගල් කොරි පවත්වා ගෙන යාමට අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සුදුසු බව දිස්ත්‍රික් කමිටුවේ තීරණය විය. | **දිස්ත්‍රික් ලේකම්** |

| අනු අංකය | සාකච්ඡා කළ ගැටළුවකාරණය/ | ගන්නා ලද තීරණය | තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම |
|---|---|---|---|
| IV. | **ගරු නගරාධිපති, මහා නගර සභාව , රත්නපුර**<br><br>මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හේතුවෙන් පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු කිරීමට නොහැකි වී ඇති බැවින් පළාත් පාලන ආයතන සතු මුදල් අත්‍යවශ්‍ය සේවාවන් වෙනුවෙන් යොදා ගැනීමට හැකි වන පරිදි එම චක්‍රලේඛය සංශෝධනය කිරීම කෙරෙහි ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන ලදී. | **පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා**<br><br>පළාත් පාලන ආයතන සතු මුදල් එම ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි එය සංශෝධනය කර ඉදිරියේදී ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව යොමු කරන බව දන්වන ලදී. | |

අද දින රැස් වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ඉතා වැදගත් තීන්දු තීරණ ගන්නා කමිටු සාකච්ඡාවක් බවට පත් වූ බවත්, මතු වූ ගැටළු දීර්ඝ ලෙස සාකච්ඡා වූ බවත් එහිදි තීරණ ගැනීමේදී රාජ්‍ය නිලධාරින්ට හා දේශපාලන අධිකාරියට විශාල කාර්ය භාරයක් හා වගකීමක් පැවරෙන බව දිස්ත්‍රික් ලේකම් විසින් පෙන්වා දෙන ලදී. මෙසේ වැදගත් වූ තීන්දු තීරණ ගැනීමට අද දින කමිටු රැස්වීම සඳහා සහභාගි වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමන් හා ගරු මැති ඇමැතිවරුන්, පළාත් පාලන ආයතන ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුලු සියලු දෙනාටම දිස්ත්‍රික් ලේකම් විසින් ස්තුතිය පුදකළ අතර අනතුරුව සභාවේ කටයුතු අවසන් කරන ලදී.

මාලනී ලොකුපෝතාගම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති , දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ ලේකම්,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය